වාර්ෂික පර්යේෂණ සැසිය
2021
සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

සිංහල අධ්‍යයන අංශය මඟින් සංවිධාන කෙරෙන වාර්ෂික පර්යේෂණ සැසිය 2021 සැප්තැම්බර් මස 16 වන දින දී පැවැත්මට කටයුතු යොදා ඇත. උසස් අධ්‍යාපනයේ මානව ශාස්ත්‍ර ඉගැන්වීම ආරම්භ වී වසර සියයක් පිරීමේ සංවත්සරයට සමගාමීව මෙම පර්යේෂණ සැසිය පැවැත්වේ. මේ සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයට මෙන්ම පර්යේෂණ පිළිබඳ උනන්දුවක් දක්වන ඔබ සියලු දෙනාට පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට අවකාශ සැලසේ. ඔබගේ පර්යේෂණ පත්‍රිකා අදාළ නිර්දේශවලට අනුගතව සකස් කළ යුතු ය. අදාළ සාර සංක්ෂේප ඉංග්‍රීසි හා සිංහල භාෂාවෙන් ඉදිරිපත් කළ හැකි ය.

පර්යේෂණ සැසිය පැවැත්වෙන දිනයඃ **2021.09.16.**

තේමාවඃ **සිංහල අධ්‍යයනයේ ශාස්ත්‍රාලීය සම්ප්‍රදානය**

උප තේමාඃ

- **සිංහල භාෂාව, ව්‍යාකරණය සහ වාග්විද්‍යාව.**
- **සම්භාව්‍ය හා නූතන සිංහල සාහිත්‍යය.**
- **සිංහල සංස්කෘතිය සහ කලා ශිල්ප.**

**ඔබගේ පර්යේෂණ පත්‍රිකාව මූලික පර්යේෂණ මත පදනම් විය යුතු අතර, විමර්ශන කමිටුව විසින් අනුමත කරන ලද පර්යේෂණ පත්‍රිකා සිංහල අධ්‍යයනාංශය මගින් වාර්ෂිකව එළි දක්වන ශාස්ත්‍රීය සංග්‍රහය මගින් ප්‍රකාශයට පත් කෙරේ.**

**සාර සංක්ෂේප එවිය යුතු අවසාන දිනයඃ 2021.05.02**

**සාර සංක්ෂේප ඉදිරිපත් කිරීමේ දී පහත ආකෘතිය අනුගමනය කළ යුතු ය.**

**1. සාරංශයඃ- ප්‍රමුඛ පද 05ක් සහිතව වචන 250ක් නොඉක්මවිය යුතුය.**

**2. සවිස්තර සාර සංක්ෂේපය (Extended Abstract) වචන 1000ක් නොඉක්මවිය යුතු අතර එය-**

- **හැඳින්වීම**
- **පර්යේෂණ ගැටලුව**
- **පර්යේෂණ අරමුණු**

- **පර්යේෂණ ක්‍රමවේද**
- **නිගමන / සමාලෝචනය**
- **පරිශීලන ග්‍රන්ථ ඇතුළත්ව සකස් කළ යුතු ය.**

**සවිස්තර සාර සංක්ෂේප සඳහා දෙන ලද උපදෙස් සහ මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර එසේ නොකරන ලද පර්යේෂණ පත්‍රිකා සංස්කාරක කමිටුව විසින් ප්‍රතික්ෂේප කෙරේ.**

## ඉදිරිපත් කිරීම් සඳහා නිර්දේශ

අකුරු මෝස්තර

- සිංහල මාධ්‍යයෙන් සිදු කෙරෙන ඉදිරිපත් කිරීම්

  **එෆ්. එම්. අභය (FMAbhaya)**

  **සිංහල අකුරු ප්‍රමාණය 12 (Fonts size)**

- ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිදු කෙරෙන ඉදිරිපත් කිරීම්

  **ටයිම්ස් නිව් රෝමන් (Times New Roman)**

  **ඉංග්‍රීසි අකුරු ප්‍රමාණය 11 (Fonts size)**

- ඡායාරූප භාවිත කරන්නේ නම් විධිමත් අනුපිළිවෙළක් යටතේ ඉදිරිපත් කළ යුතු ය.
- අන්තර්ගත කරුණු අතර අවධාරණය විය යුතු කරුණු සඳහා තද කලු වර්ණ (Bold) අකුරු භාවිත කළ යුතු ය.

**සංවිධායකවරු**

ආචාර්ය ජයන්ති බණ්ඩාර - 071 2627773

ආචාර්ය කුමුදු කරුණාරත්න - 071 2712808